**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය පරිශ්‍ර ආශ්‍රිත සුළු අලෙවිසැල් බදු ලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් දුම්රිය පරිශ්‍ර ආශ්‍රිත වල පවතින සුළු අලෙවිසැල් වසර දෙකක කාලයකට ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදු ලබාදීම පිණිස ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | සුළු අලෙවිසැල | ප්‍රමාණය (ව.අ.) |
|---|---|---|
| 1 | ළමාගාරය 01 දුම්රිය නැවතුම අසල සුළු අලෙවිසැල | 16 |
| 2 | උකුවෙල 01 සුළු අලෙවිසැල | 240 |
| 3 | උකුවෙල 02 සුළු අලෙවිසැල | 240 |
| 4 | උකුවෙල 03 සුළු අලෙවිසැල | 240 |
| 5 | උකුවෙල 04 සුළු අලෙවිසැල | 240 |
| 6 | උකුවෙල 05 සුළු අලෙවිසැල | 240 |
| 7 | උකුවෙල 06 සුළු අලෙවිසැල | 240 |
| 8 | උකුවෙල 07 සුළු අලෙවිසැල | 240 |
| 9 | වදුරව සුළු අලෙවිසැල | 25 |
| 10 | මාතලේ සුළු අලෙවිසැල 01 | 200 |
| 11 | මාතලේ මාළු අලෙවිසැල | 60 |
| 12 | මිරිස්වත්ත සුළු අලෙවිසැල | 16 |
| 13 | ගනේමුල්ල සුළු අලෙවිසැල | 60 |
| 14 | පන්නිපිටිය සුළු අලෙවිසැල | 24 |
| 15 | දෙමෝදර සුළු අලෙවිසැල | 24 |
| 16 | නෙළුම් කුළුණ අසල සුළු අලෙවිසැල | 600 |
| 17 | අලව්ව ලොතරැයි අලෙවි කුටිය | 24 |
| 18 | අලව්ව දුම්රිය ස්ථානය අසල කඩල කරත්තය | 24 |

| අනු අංකය | සුළු අලෙවිසැල | ප්‍රමාණය (ව.අ.) |
|---|---|---|
| 19 | රාගම ලොතරැයි අලෙවි කුටිය | 24 |
| 20 | රාගම දුම්රිය ස්ථාන සුළු අලෙවිසැල | 30 |
| 21 | මරදාන 3 – 4 වේදිකා සුළු අලෙවිසැල | 28 |
| 22 | හෝමාගම සුළු අලෙවිසැල | 120 |
| 23 | නාත්තණ්ඩිය සුළු අලෙවිසැල | 100 |
| 24 | ගම්පහ ලොතරැයි අලෙවිසැල | 12 |
| 25 | ගම්පහ සුළු අලෙවිසැල (කොළකැඳ) | 24 |
| 26 | මොරටුව දුම්රිය ස්ථාන සුළු අලෙවිසැල (දුම්රිය ස්ථාන භෝජනාගාරය) | |
| 27 | මොරටුව දුම්රිය ස්ථාන ලොතරැයි අලෙවිසැල | 30 |
| 28 | අඹේපුස්ස දුම්රිය ස්ථානයට යාබද සුළු අලෙවිසැල | 25 |
| 29 | මාදම්පේ දුම්රිය ස්ථාන සුළු අලෙවිසැල | 100 |
| 30 | මීගමුව දුම්රිය ස්ථාන සුළු අලෙවිසැල (දුම්රිය ස්ථාන භෝජනාගාරය) | |
| 31 | අම්බලන්ගොඩ දුම්රිය ස්ථාන සුළු අලෙවිසැල | 30 |

**01.සුදුසුකම්**

ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ප්‍රසම්පාදන ලියවිලි **2026 මැයි මස 21** වන දින ප.ව.2.00 දක්වා දුම්රිය මූලස්ථානයේ වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ ආදාල දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි වෙත හෝ ආදාල දුම්රිය ස්ථානයෙන් ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත හෝ දුම්රිය ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු අයදුම්පතෙහි උපලේඛණ 01 හි සඳහන් එක් එක් අලෙවිසැල් සඳහා වෙනම සලකා ලංසු ඉදිරිපත්කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත් කල හැක්කේ එක් සුළු අලෙවිසැලක් සඳහා පමණි.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ“ .................... (සුළු අලෙවිසැලෙහි නම) සුළු අලෙවිසැල සඳහා මිල ගණන් කැඳවීම ” යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා **2026 මැයි මස 22** වන දින ප.ව 01.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු බාරගැනීම හා විවෘත කිරීම**

**2026 මැයි මස 22** වන දින ප.ව. 01.00 ට ඉහත 03 ජේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

**06.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**07.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය - 8235)/ 011-4600944 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෙළඳ හා අලෙවි කාර්යාලය,
දුම්රිය මූලස්ථානය,ඔල්කට් මාවත,කොළඹ 10.